බලංගොඩ ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුලි 20 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් සභාව සතු ඉඩම් 16 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ජර්නල් වවුචර් සහ ජර්නල් සටහන් පිළියෙල කිරීමකින් තොරව ලැබිය යුතු, ඉදිරියට ලද සහ අවසන් තොග වලට සම්බන්ධ ගිණුම් 14 කට අදාළ එකතුව රු. 20,313,692 ක් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉන්වෙන්ට්‍රි ගතකරන ලද වටිනාකම රු. 9,625 ක් වූ ළමා ප්ලාස්ටික් පුටු 25 ක් අවසන් තොග ලෙස දක්වා තිබුණි.

(ඈ) රු. 36,694 ක් වූ ලිපිද්‍රව්‍ය ආරම්භක තොගය සහ රු. 24,895 ක් වූ ලිපිද්‍රව්‍ය අවසන් තොගය ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දාමහන ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 994,980 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළව සම්ප්‍රේෂණ කුළුණු 04 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු. 12,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(උ) නිකුත් කරන ලද එකතුව රු. 9,450 ක් වූ චෙක්පත් දෙකක් කල් ඉකුත් වීම නිසා ආදායමට ගැනීමේදී වියදම් ආපසු ගෙවීමේ ගිණුමට හර කර තිබුණි.

(ඌ) සේවකයන් තිදෙනෙකුගෙන් වැඩිපුර අයකරන ලද සේවක ණය වාරික එකතුව රු. 12,500 ක් වගකීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සුළං විදුලි බලාගාරයෙන් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු රු. 63,690 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්
----------------------------------

(අ) ලැබියයුතු ගිණුම්
-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු වර්ෂ 06 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අක්කර බදු රු. 14,037 ක් 2018 මාර්තු වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 09 කට වඩා වැඩි කාලයක සිට පැවත එන වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු. 96,100 ක් 2018 මාර්තු වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබියයුතු වෙළිඔය කඩ කාමර බදු කුලී රු. 16,818 ක් 2018 මාර්තු වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(iv) සභාවට අයත් පදිංචිය සඳහා බදු දී තිබුණු යහකළු මූකලාන ප්‍රදේශයේ බිම් කට්ටි 09 ක් වෙනුවෙන් 1996 වර්ෂයේ සිට අයවිය යුතු කුලී රු. 43,350 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

--------------------

2009, 2012, 2015 සහ 2016 වර්ෂ වලට අදාළව එකතුව රු. 288,895 ක් වූ වියදම් ණයගිමි ශේෂ 06 ක් නිරවුල් කිරීමට 2018 මාර්තු වනවිටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 142,362,930 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) එකතුව රු. 130,986,164 ක් වූ ජර්නල් සටහන් 27 ක් සඳහා ජර්නල් වවුචර් ඉදිරිපත් නොකෙරුණි.

1.3.4. අනුකූල නොවීම

--------------------

1.3.4.1 නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත | | 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා නිකුත් කරන ලද වලංගු කාලය අවසන් වී තිබුණු කර්මාන්ත 03 ක ක්‍රියාකාරීත්වය පරීක්ෂාකර අවශ්‍යතාවය අනුව නැවත බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව 2015 වර්ෂයේ සිට අලුතින් ආරම්භ කර තිබුණු කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් 2018 මාර්තු වනවිටත් සිදුකර නොතිබුණි. |

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති

(ආ)

| | | |
|---|---|---|
| (□) 14 රීතිය | 6,514 ,077 | අයවැය ලේඛනයෙන් ආවරණය නොවන ව්‍යාපෘති 06 ක වියදම් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් සකස් කර මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (□□) 143 රීතිය | - | එක් එක් පන්තියේ තැන්පතු වලට අදාලව ලෙජරය මාසිකව තුලනය කර එම ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර් ගිණුමේ ශේෂය සමඟ ගැලපීමට කටයුතු කර නොතිබුණි. |
| (□□□) 178(6)(5) රීතිය | - | සභාව විසින් තීරණය කරන ලද පරිදි කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (□□) 214 රීතිය | 125,490 | 2017 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ගබඩා තොගය සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 262(2) | 1,927,695 | ගෙවන ලද සියලුම වවුචර්වලට හා ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලට "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු නමුත් ගෙවීම් වවුචර් 17 ක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(5) | 489,589 | 1992 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නිකුත් කරන ලද අත්තිකාරම් 35 ක් 2018 මාර්තු වන විටත් පියවා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | 981,934 | 2017 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ පැවති හිමිකම් නොපාන ලද "ඉකුත් වූ□ තැන්පතු 258 ක් පිළිබඳව ලැයිස්තු පිළියෙල කර තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 574 | - | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම බඩු ලේඛන පොත්වල ලැබීම් හා නිකුත් කිරීම් ගලපා තුලනය කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 770,580 | සභාව සතුව පවතින පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2009 ජූනි 09 දිනැති අංක 2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | |
| | 3.1 වගන්තිය | 11,428,993 | විධායක ඉංජිනේරු සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම්කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් ප්‍රජාපාදක සංවිධානයේ සුදුසුකම් පරික්ෂාකර සුදුසු කොන්ත්‍රාත් කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, කොන්ත්‍රාත් 20 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2015 ජූලි 15 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජූනි 05 දිනැති අංක PCMO/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය | - | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ගර්හිත තත්වයේ පවතින කැබ් රථයක්, රෝද හතරේ ට්‍රැක්ටර් දෙකක්, රෝද දෙකේ ට්‍රැක්ටර් 3ක්, ට්‍රැක්ටර් ටේලර් 4ක් සහ ට්‍රැක්ටර් කොටස් 22 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 1975 පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝගයේ 36 වගන්තිය | 1,011,237 | 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන සේවයේ විශ්‍රාමික නිළධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
--------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,830,848 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,957,476 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | 2016<br>ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,523,380 | 1,523,380 | 2,324,990 | 253,318 | 1,438,380 | 1,438,380 | 1,648,647 | 250,585 |
| (ii) | කුලී | 3,553,375 | 3,553,375 | 2,188,057 | 158,343 | 4,175,955 | 4,175,955 | 1,268,775 | 99,848 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 232,500 | 232,500 | 312,310 | 96,100 | 264,500 | 264,500 | 287,453 | 109,700 |
| (iv) | වෙනත් ආදායම් | 71,595,637 | 71,595,637 | 46,236,234 | 14,977,541 | 68,354,029 | 68,354,029 | 48,499,403 | 15,652,610 |

### 2.2.2. ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී කුලී ආදායමේ බිල් කළ ආදායම රු. 622,580 කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අයකර ගත නොහැකි රු. 186,988 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව තිබූ වරිපනම් බදු රු. 213,635 ක් 2018 මාර්තු වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දින වනවිට සභා බල ප්‍රදේශය තුළ හඳුනාගන්නා ලද වරිපනම් බදු ඒකක 645 ක් සඳහා 2005 වර්ෂයේදී සිදුකල තක්සේරු අගයයන් 2009 වර්ෂයේ සිට වර්තමානය දක්වාම අයකරමින් තිබෙන අතර පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය ප්‍රකාරව නව තක්සේරුවක් මගින් වරිපනම් බදු සංශෝධනය කර වරිපනම් ආදායම වැඩි කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) ජලගාස්තු

2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 14,440 ක් වූ ලැබිය යුතු ජල ගාස්තු 2018 මාර්තු වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,197,253 ක් හා 2015 වර්ෂයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු හඳුනා ගෙන අයකර ගැනීමට 2018 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කාර්යසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභා බලප්‍රදේශයේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් සකස් කිරීමට කටයුතු කර නොතිබුණු අතර දිරන හා නොදිරන කසළ වෙන්කිරීමකින් තොරව සභා බලප්‍රදේශයේ ස්ථාන කිහිපයකට බැහැර කරන බව නිරීක්ෂණය විය.

(ii) සභාව මඟින් ගොඩකුඹුර ග්‍රාම නිලධාරි වසමේ අනිච්චියාවත්ත හේන නැමති ස්ථානයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අක්කරයක ඉඩමක් වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් 2015 වර්ෂයේ රු. 22,600 ක වාර්ෂික බදු පදනම මත ලබාගෙන තිබුණද, මහජන විරෝධතාව හේතුවෙන් එම ඉඩම අතහැර තිබුණි. එමෙන්ම කසළ බැහැර කිරීම සඳහා සුදුසු වෙනත් ස්ථානයක් හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍යය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සභාවට ලැබී තිබූ එකතුව රු. 6,765,000 ක් වූ ට්‍රැක්ටර් 03 ක් සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 1994 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ කොන්ත්‍රාත්කරුවන් 69 දෙනෙකුට ගෙවිය යුතු රු. 280,711 ක් වූ කොන්ත්‍රාත් ඇප මුදල් සම්බන්ධයෙන් 2018 මාර්තු වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2015 ජුනි 20 දින පැවති මහා සභා රැස්වීමේ තීරණය අනුව සභා කාර්යාලයේ ගරාජයට අවහිරව පැවති කපා ඉවත්කරන ලද කොස් ගස් වල කඳන් ඉරා ලී බවට පත් කිරීමට ගෙන තිබූ තීරණය 2018 මාර්තු වනවිටත් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ඝන මීටර් 35.48 ක් වූ කොස් දැව දිරා යාමට ලක්වෙමින් තිබුණි.

(ඈ) ගිනි නිවන උපකරණ කට්ටල් 02 ක් දාමහන ආදාහනාගාරයේ සවිකිරීම සඳහා 2015 මැයි මස ගෙන තිබූ සභා තීරණය 2018 මාර්තු වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ දාමහන ආදාහනාගාරයේ නාම පුවරුව අලුත්වැඩියා කිරීම සඳහා රු. 200,000 ක් වියදමක් ලෙස ගිණුම්ගත කර ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සලසා තිබුණ ද, අදාල කාර්යය 2018 මාර්තු වනවිටත් ඉටුකර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තෘතීය සේවා මට්ටමේ රාජ්‍ය කළමනාකරණ සහකාර, අධිශ්‍රේණියේ ලේකම් තනතුර පුරප්පාඩු වී තිබුණු අතර රාජ්‍ය කළමනාකරණ I ශ්‍රේණියේ නිලධාරිණියක 2017 වර්ෂයේ සිට ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් පත් කර තිබුණි.

(ආ) ආදායම් පරීක්ෂක, වැඩ ක්ෂේත්‍ර පරිපාලක, ආයුර්වේද ඖෂධ සංයෝජක, ආදාහනාගාර ක්‍රියාකරු, පුස්තකාලයාධිපති, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු, සෞඛ්‍ය කම්කරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු හා රියදුරු යන තනතුරුවල පවතින පුරප්පාඩු 12 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට බාධා වී තිබුණි.

(ඇ) ගණන්දීමේ නිලධාරියෙකු විසින් එක් එක් ගණුදෙණුව නිළධාරීන් දෙතුන් දෙනෙකුගේ මාර්ගයෙන් පරීක්ෂණයට භාජනය වන පරිද්දෙන් හැකි සෑම අවස්ථාවකදීම කීපදෙනෙකු අතර රාජකාරි බෙදා නියම කල යුතු වුවත්, මුදල් පොත, තැන්පත්, ණයහිමි හා අත්තිකාරම් ලේඛන පවත්වාගෙන යාම, චෙක්පත් ලිවීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, ගිණුම් වාර්තා පිළියෙල කිරීම සහ අවසාන ගිණුම් සකස් කිරීම යන කාර්යයන් එක් සංවර්ධන නිළධාරිණියකට පවරා තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------
ඉඩම් කට්ටිකර විකිණීම
----------------------------
2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වෙන්දේසි කරන ලද ඉඩම් 07 ක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ඉඩම් විකිණීම්වලට අදාලව කට්ටි සැලැස්ම අනුමත කිරීමට පෙරාතුව විකිණීමට යටත් බිම් කොටස්වල, සත්‍ය වටිනාකම පිළිබඳව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වෙන්දේසි කරන ලද ඉඩම් 21 ක් සම්බන්ධයෙන් විකුණනු ලබන ඉඩම් වටිනාකමට අදාළ සියයට 1 ක බදු මුදල ඉඩම් විකිණීමත් සමඟ විකුණුම්කරු විසින් සභාවට ගෙවන බවට කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඉඩම් වෙන්දේසි 6 කින් සභාවට වෙන් කරන ලද අක්කර 02 රූඩ් 03 හා පර්චස් 36.14 ක් ඔප්පු මඟින් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 මතභේදයට තුඩුදුන් ගණුදෙනු
----------------------------------
දූවිලි ඇල්ල සංචාරක කලාපයට ඇතුලු වීමේ ප්‍රවේශපත්‍ර කුවිතාන්සි පොත් 320 ක් මුද්‍රණය කිරීමට සභාවේ ලේකම් විසින් අනුමත කර තිබුණු අතර ඊට අමතරව සභා අනුමැතියකින් තොරව පොත් 180 ක් මුද්‍රණය කර තිබුණි. ඉන් පොත් 330 ක් සභාවේ ගබඩාවට ලැබී තිබුණු අතර ඉතිරි පොත් 170 ක ප්‍රමාණය 2018 මාර්තු වනවිටත් ලැබී නොතිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

-------------------------------

3.6.1 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතු වටිනාකම රු. 5,265,318 ක් වූ වාහන හා යන්ත්‍ර උපකරණ වර්ෂ තුනකට වැඩි කාලපරිච්ඡේදයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වටිනාකම රු. 8,855 ක් වූ ප්ලාස්ටික් ළමා පුටු 23 ක් 2001 වර්ෂයේ සිට නිෂ්කාර්යව ගබඩාව තුල තිබුණි.

3.7 ප්‍රසම්පාදනය

----------------

3.7.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

දාමහන ආදාහනාගාරය ඉදිකිරීම

--------------------------------------

ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගම විසින් 2016 ජනවාරි 26 දින සභාව වෙත ඉදිරිපත් කර තිබූ රු. 7,966,556 ක් වූ අවසන් බිල්පතෙහි අඩුපාඩු පැවතීම සහ ආදාහනාගාරයේ දැවීම් ඒකකයට අදාළ විශේෂ ගාස්තු උපලේඛන (SSR) පිළිබඳව අවසන් එකඟතාවයකට පැමිණීමට නොහැකි වීම මත බිල්පත නිර්දේශ කිරීමට නොහැකි බව ඉදිකිරීම් අධීක්ෂණය කල කාර්මික නිලධාරී 2016 අගෝස්තු මාසයේදී දන්වා තිබුණ ද, ඒ සම්බන්ධයෙන් 2018 මාර්තු වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය තුල සභාවේ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 48.33 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 31.31 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 17.02 ක් හෙවත් සියයට 35 ක් උපයෝජනය කර නොතිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. මිලියන 27.66 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 12.78 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 14.88 ක් හෙවත් සියයට 54 ක් උපයෝජනය කර නොතිබුණි. එමෙන්ම සභාව සතු යන්ත්‍ර කුලියට දීමෙන් රු. මිලියන 2.7 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, තත්‍ය ආදායම රු. මිලියන 1.58 ක් වීමෙන් එම ආදායම සියයට 42 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| | (ii) ආදායම්, වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම් ගත කිරීම |
| | (iii) ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් පිළියෙල නොකිරීම |
| | (iv) අවසන් තොග මැනීම සහ ගිණුම්ගත නොකිරීම |
| (ආ) අයවැය පාලනය | (i) වැය ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | (ii) ඇස්තමේන්තු ගත ආදායම් අයකර නොගැනීම |
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අය කර නොගැනීම |
| (ඈ) මානව සම්පත් කළමනාකරණය | (i) පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම |
| | (ii) වැඩ බෙදීමකට ලක් නොකිරීම |
| (ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් නොතිබීම. |
| (ඊ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) සැලසුම අනුව වැඩ අවසන් නොකිරීම |
| | (ii) ඉදිකිරීම් නිසිපරිදි නඩත්තු නොකිරීම |